# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
පොලිස් මූලස්ථානය, ... (සෙත්සිරිපාය, බත්තරමුල්ල)

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 307/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 20/02/2024<br>පැය 1240 |

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.02.19 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 58 | - | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2024.02.18 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත රාගම පොලිස් වසමේ රාගම ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 මිලි ග්‍රෑම් 680ක් සමග සැකකාරියක් අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 45 ක් වූ කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.** රාගම වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව පස් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2024.02.19 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඕමන්ත පොලිස් වසමේ වේරකල්ලු ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ස්කැවේටර් රථයක් යොදා ගනිමින් පස් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඕමන්ත පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. නීති විරෝධි ලෙස වේ ගඟ ආශ්‍රිතව පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් හත් දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.02.19 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නිවිතිගල පොලිස් වසමේ වේ ගඟ ආශ්‍රිතව වැටලීමක් සිදු කර නීති විරෝධි ලෙස පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් හත් දෙනෙකු එම කැණීම් කටයුතු සිදු කිරීමට උපයෝගී කර ගන්නා උපකරණ තොගයක්ද සමඟ අත්අඩංගුවට ගෙන ඇහැළියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 ත් 62 ත් අතර වයස් වල පසුවන නිවිතිගල, නීකිරිගල, පන්දෙනිය, අවිස්සාවේල්ල හා දැල යන** ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

**05. නීති විරෝධි ලෙස පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් පස්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2024.02.19 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පස්සර පොලිස් වසමේ දෙල්ගොල්ල ඔයේ වැටලීමක් සිදු කර නීති විරෝධි ලෙස පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් හත් දෙනෙකු අත්අඩංගුවට ගෙන පස්සර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 ත් 48 ත් අතර වයස් වල පසුවන පස්සර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**